**මන්නාරම දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 13- 2023**

**-------------------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා දහතුනක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තරාත්මක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13ට අදාළ 2023 වර්ෂයේ නිකුත් කර තිබුණ විගණන වාර්තා සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර එ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05කට අයත් ඉඩම්, ගොඩනැගිලි සහ දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණවල වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි. | පවරාගැනීම් සිදුකිරීමෙන් පසු වත්කම්වල වටිනාකම තක්සේරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන බව. | වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03කට ලැබිය යුතු රු. 3,121,925ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදාල වටිනාකම් ලැබිය යුතු ලෙස හෙළිදරව් කිරීමට පියවර ගනු ලබන බව. | නිවරදි ශේෂයන් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සැකසිය යුතය. |
| (ඇ) | උයිලංකුලම් ගොවිජන සේවා කාරක සභාව විසින් පරිත්‍යාග ආදායම් ලෙස ලැබූ රු.244,000ක් බැරකමක් ලෙස හෙළිදරව් කිරීමෙන් එම ප්‍රමාණයෙන් බැරකම් වැඩියෙන් සහ අතිරික්තය අඩුවෙනුත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පරිත්‍යාග දායකත්ව ආදායමට මාරුකිරීමට පියවර ගෙන ඇති අතර ඉදිරියේදී මෙවැනි දෝෂ සිදුනොවීමට උපදෙස් ලබාදී ඇති බව. | -එම- |
| (ඇ) | සිලාවතුර ගොවිජන සේවා කාරක සභාවට ලැබී තිබූ පොහොර අත්තිකාරම් රු.170,000ක් බැරකම් ලෙස මූල්‍ය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අත්තිකාරම් ලෙස ලබාගත් මුදල කොටස් වශයෙන් ගෙවීමට පියවර ගෙන ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පෙරියපුල්ලච්චි පොට්කේනි ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබූ එකතුව රු.7,830,000ක පිරිවැය වූ ගොඩනැගිල්ල සහ ට්‍රැක්ටර් අංගනය සඳහා ක්ෂය ගණනය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඊ) | ආට්කාට්ටිවෙලි ගොවිජන සේවා කාරක සභාව විසින් 2010 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබූ රු. 7,685,000ක යන්ත්‍ර කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමෙන් පසුව මෙම වටිනාකම සමුච්චිත අරමුදලට එකතුකර, සමුච්චිත අරමුදල ගැලපීමට පියවර ගනු ලබන බව. | -එම- |
| (උ) | ගොවිජන සේවා කාරක සභා 10ක එකතුව රු. 2,932,284ක් වූ වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය විවිධ කරුණු හේතුවෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙවැනි ගිණුම්කරණ දොෂ නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | -එම- |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා 03ක ජංගම වත්කම්වල එකතුව රු. 863,540ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ඉදිරි කාලයේදී ජංගම වත්කම් ලෙස අනාවරණය කිරීමට පියවර ගනු ලබන බව. | -එම- |

### 1.3.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 09ක සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු. 12,101,368ක් වූ අත්තිකාරම් ශේෂ 02ක්, ස්ථාවර තැන්පතු ශේෂ, ලැබිය යුතු මුදල් ශේෂ 08ක්, ගෙවිය යුතු ශේෂ 02ක් සහ පරිත්‍යාග තහවුරු කිරිමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීමෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ප්‍රමාණවත් තොරතුරු නොමැති හෙයින් මේවා ගිණුම්වලින් ගැලපීම් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ ශේෂයන් සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළයුතුය. |

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උයිලංකුලම ගොවිජන සේවා කාරක සභාවේ ශේෂපත්‍රයේ 2011 වර්ෂයේ සිට පැවැත එන අවිනිශ්චිත චෙක්පත් ලැබීම් රු.447,462ක් සම්න්ධයෙන් කරුණු සොයා බලා නිරවුල් කිරීමට ඵලදායි පියවර ගෙන නොතිබුණි. | අවිනිශ්චිත (හර) ලැබීම් නිරවුල් කිරීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයාගේ උපදෙස් සඳහා යවා ඇති බව. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2020 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) | 44(1) වගන්තිය | සෑම ගොවිජන සංවිධානයකම වාර්ෂික ගිණුම් කොමසාරිස් ජනරාල් වරයා විසින් බලය පැවරූ නිලධාරියෙකු විසින් පරීක්ෂා කළයුතු බව සඳහන් වුවත්, ගොවිජන සේවා කාරක සභා 13ක ගිණුම් ඒ අයුරින් පරීක්ෂා කර නොතිබුණි. | ඉදිරි කාලයේදී නියමිත පරිදි ගිණුම් පරීක්ෂා කිරිමට උපදෙස් ලබාදී ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව පියවර ගතයුතුය. |
| (ii) | 45(1) වගන්තිය | කෘෂිකාර්මික ඉඩම් ලේඛන, ගොවිජන සේවා කොමාසාරිස්වරයා විසින් සහතික කළයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 13ක ලේඛන ගොවිජන සේවා කොමාසාරිස්වරයා විසින් සහතික කර නොතිබුණි. | සෑම කුඹුරු ඉඩමක්ම මැනීමේ වැඩසටහන අවසන් වූ පසුව කෘෂිකාර්මික ඉඩම් ලේඛන, ගොවිජන සේවා කොමාසාරිස්වරයා විසින් සහතික කරනු ලබන බව. | -එම- |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ - **II** කොටසේ 9.1 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 13ක් විසින් මුදල්, චෙක්පත් හා ගබඩා භාර කටයුතුවල නිරත නිලධාරීන්ගෙන් ඇප මුදල් පසුගිය වර්ෂ 04ක සිට ලබාගෙන නොතිබුණි. | සම්බන්ධිත නිලධාරීන්ගෙන් ඇප මුදල් රැස්කර බැංකුවේ තැන්පත් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 13හි මෙහෙයුම් ප්‍රතිඵල රු. 24,799,740 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 10,918,767 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලවල රු. 35,718,507ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 10ක් විසින් දීර්ඝ කාලයක සිට අයකළ යුතු එකතුව රු. 7,887,653ක ලැබිය යුතු මුදල් අය කිරීමට පියවර ගෙන නොතිබුණි. | ගිණුම් වාර්තාවල ගැලපුම් කිරීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයාගේ අනුමැතියට යවා ඇති බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06ක් විසින් දීර්ඝකාලයක සිට ගෙවිය යුතු ශේෂ එකතුව රු. 3,157,855ක් ගෙවා අවසන් කිරීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගතයුතුය. |

### 3.2 නිෂ්කාර්ය දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10ක පැවැති ට්‍රැක්ටර් 59ක් සහ වර්ග 04ක වත්කම් 18ක් වර්ෂ 08කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවැති අතර ඒවා විධිමත් පරිදි අපහරණය කිරීමට හෝ නැවත භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නැවත භාවිතා කළහැකි ඒවා පරිහරණය කිරීමටත්, ඉතිරි ඒවා තක්සේරු කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඉවත් කිරීමටත් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා යවා ඇති බව. | වත්කම් පූර්ණ උපයෝජනය කිරීම හෝ විධිමත් පරිදි අපහරණය කිරීම කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 13ක 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර විධිමත් මානව සම්පත් සැලැස්මක් සකස්කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඉදිරි කාලයේදී අදාල විස්තර විගණනයට ඉදිරිපත් කරනු ලබන අතර විධිමත් මානව සම්පත් සැලැස්මක් සකස් කරනු ලබන බව. | කාර්ය මණ්ඩල විස්තර ඇතළත් කර මානව සම්පත් සැලැස්ම සකස් කළ යුතුය. |

### 3.4 වාහන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 13ක පැවැති ට්‍රැක්ටර්වල හිමිකාරිත්වය පවරා ගැනීමටත්, වාහන ලොග් සටහන් පොත් සහ දෛනික ධාවන සටහන් යාවත්කාලීනව පවත්වාගෙන යාමට පියවර ගෙන නොතිබුණි. | ගොවිජන සේවා මධ්‍යස්ථානවල පවතින සියළු ට්‍රැක්ටර්වල හිමිකාරිත්වය පවරා ගැනීමට සහ දෛනික ධාවන සටහන් යාවත්කාලීනව පවත්වාගෙන යාමට පියවර ගනු ලබන බව. | හිමිකාරිත්වය පවරා ගැනීමටත් ලොග් සටහන් පොත් සහ ධාවන සටහන් යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් පියවර ගතයුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනැති අංක 02/2020 දරන ගොවිජන සංවර්ධන චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරි කාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරිම සඳහා ගොවිජන සේවා කාරක සභා 13ට උපදෙස් ලබාදී ඇති බව. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයාගේ 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව, 01 සිට 16ක් දක්වා වූ ආදායම් නිසි පරිදි හඳුනාගෙන තක්සේරු කර සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය විසින් සකස් කළ ආකෘතියට අනුකූලව ආදායම් ඇස්තමේන්තු සකස් කරන කරන බව. | චක්‍රලේඛයට අනුව ආදායම් ඇස්තමේන්තුව සකස් කළ යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව, තිරසාර සංවර්ධන අරමුණු (2030 වර්ෂයේ) ළඟාකර ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා විසින් වාර්ෂිකව ඉටුකළ යුතු ඉලක්ක, එම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළයුතු දෑ සහ එහි ප්‍රගතිය මැනීමේ දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා වාර්ෂිකව ඉටුකළ යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමත් එහි ප්‍රගතිය මැනීමේ දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ අවශ්‍යතා ඉටුකිරීමට පියවර ගත යුතුය. |

## 5. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන කාරක සභා 07ක් විසින් 2018 - 2022 කාලපරිච්ඡේදයේ ගොවීන්ට ලබාදුන් ණය මුදලින් රු.1,460,759ක් අයකර ගෙන නොතිබුණි. | නියමිත ණය ලබාගත් අය වෙත දුරකථන සහ ලිපි මගින් සිහිකැඳවීම් සිදුකර අදාල ණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟ ණය මුදල් අයකර ගැනීමට පියවර ගතයුතුය. |

## 6. පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 සහ 134 ප්‍රකාරව, ගොවිජන සේවා කාරක සභා 13ක විධායක කමිටුවල ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණන පරීක්ෂාවට ලක්කිරීමට ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් පසුගිය වර්ෂ 10කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් ඉදිරි කාලයේ සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |